# සීමා නිර්ණ අවසන් පළාත් පාලන ආයතනවල ඡන්දය ඉල්ලයි

**– පැෆරල් ශ්‍රේෂ්ඨාධිකරණයට**

**ඉන්දික තේවාවිතාරණ**

සීමා නිර්ණ කටයුතු අවසන් කර තිබෙන පළාත් පාලන ආයතනවල මැතිවරණය පවත්වන ලෙස ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට මේ මස 07 වැනිදා පැමිණිල්ලක් ඉදිරිපත් කරන බව පැෆරල් සංවිධානය සඳහන් කරයි.

PAGE 1

# සීමා නිර්ණ අවසන් පළාත්...

මීට අමතරව මෙම පැමිණිල්ල මගින් සීමා නිර්ණ කටයුතු අවසන් කොට නොමැති පළාත් පාලන ආයතනවල සීමා නිර්ණ කටයුතු අවසන් කරන නිශ්චිත දිනයක් ප්‍රකාශයට පත් කරන ලෙස සහ පනතේ ගැටලු විසඳු අවසන් කරන දිනය ප්‍රකාශයට පත් කරන ලෙසටද ඉල්ලා සිටින බව එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පවසා සිටියේය.

පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට නම් ආයතන බල ප්‍රදේශ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කළ යුතු බවත්, එම කටයුත්ත සිදුකළ යුතු වන්නේ පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය විසින් බවත් ඔහු පවසා සිටියේය.

මේ නිසා සීමා නිර්ණ කටයුතු අවසන් කර තිබෙන පළාත් පාලන ආයතන බල ප්‍රදේශ ගැසට් නිවේදනයකින් ප්‍රකාශයට පත් කර අදාළ බල ප්‍රදේශවලට පත්වන නියෝජිතයන් ප්‍රමාණය ගැසට් කරන ලෙසට විෂය භාර අමාත්‍යාංශයට නියෝග කරන ලෙසටද මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිටින බව රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

සීමා නිර්ණ කටයුතු අවසන් කර නොමැති ආයතනවල එම කටයුතු අවසන් කරන නිශ්චිත දිනය අධිකරණයට සඳහන් කරන ලෙසටද ඉල්ලීමක් කරන බවත්, මේ වසරේ ජනවාරි මාසයේදී හා මාර්තු මාසයේදී අදාළ කටයුතු අවසන් කරන බවට පොරොන්දු වුවද එම කාලවලදී එම කටයුතු සිදු නොවීම එයට හේතුව බවත් ඔහු කියා සිටියේය.

අගෝස්තු මාසයේදී එම කටයුතු අවසන් කරන බව සඳහන් කළද එම කාලය තුළදීත් එම කටයුතු සිදුවේවිද යන ගැටලුව ඇති වී තිබෙන බවත්, මේ නිසා අදාළ නිශ්චිත දිනය අධිකරණයට පවසන ලෙසට ඉල්ලීමක් කරන බවත් ඒ මහතා කියා සිටියේය.

මැතිවරණ කල්දැමීම සාධාරණ නොවන අතර සීමා නිර්ණ ගැටලු විසඳු පමණින් මැතිවරණය පැවැත්වීමට නොහැකි බවත්, පනත තුළද ගැටලු ඇති වී තිබෙන බැවින් එම ගැටලුද කඩිනමින් විසඳන ලෙසට ඉල්ලීමක් කරන බවත් රෝහණ හෙට්ටිආරච්චි මහතා තවදුරටත් කියා සිටියේය.